**මීගමුව අධ්‍යාපන කලාපය**
**දෙවන වාර ඇගයීම - 2025**
**ඉතිහාසය**

විභාග අංකය / නම :.............................................................................................

| 6 ශ්‍රේණිය | | කාලය පැය 02 |
|---|---|---|

## I කොටස

★ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) මහාවංශය රචනා කරන ලද කර්තෘවරයා වන්නේ,
(i) රාහුල හිමි (ii) මහානාම හිමි.
(iii) පාහියන් හිමි. (iv) බුද්ධඝෝෂ හිමි.

(2) ශකවරුන් පරදා එම ප්‍රදේශ ජයග්‍රහය සිහිකිරීම පිණිස, වර්ෂ ක්‍රමයක් ආරම්භ කළ රජතුමා වන්නේ,
(i) අශෝක රජු ය. (ii) අක්බාර් රජු ය.
(iii) අන්හෙනතන් රජු ය. (iv) ගෞතම්පුත්‍ර සාතකර්ණී රජු ය.

(3) පොළොන්නරුවේ ගල් විහාරය කරවන ලද්දේ?
(i) පළමුවන පරාක්‍රමබාහු රජතුමා ය. (ii) වසභ රජතුමා ය.
(iii) මහසෙන් රජතුමාය. (iv) පළමුවන විජයබාහු රජතුමා ය.

(4) ගොඩබිම පහළ වූ පාද කිහිපයක් තිබෙන හැකරැල්ලන් වැනි සතුන් බිහිවූයේ කුමන යුගයක ද?
(i) පැලියොසොයික යුගයේදී (ii) හොලෝසීන යුගයේ දී.
(iii) මහා හිම යුගයේද දී. (iv) සිලූරියන් යුගයේ දී.

(5) ''ඔපබිනියා'' නම් සතෙකුගේ සළකුණක් සොයාගත්තේ ?,
(i) අප්‍රිකාවෙන් ය. (ii) ඊශ්‍රායලයෙන් ය.
(iii) කැනඩාවෙන් ය. (iv) චීනයෙන් ය.

(6) ගින්දර භාවිත කිරීමට පුරුදු වූ මානවයා වන්නේ,
(i) හෝමෝ හැබිලිස් (ii) ඔස්ට්‍රලොපිතිකස්
(iii) හෝමෝ ඉරෙක්ටස් (iv) හෝමෝ නියැන්ඩතාලන්සිස්

(7) ''හැකි මිනිසා'' යනුවෙන් හැඳින්වූ මානවයා වන්නේ,
(i) හෝමෝ හැබිලිස් (ii) හෝමෝ ඉරෙක්ටස්
(iii) ඔස්ට්‍රලොපිතිකස් (iv) හෝමෝ නියැන්ඩතාලන්සිස්

(8) අප කාගේත් ළඟම මානවයා ලෙස සලකන්නේ,
(i) හෝමෝ නියැන්ඩතාලන්සිස් (ii) හෝමෝ සාපියන්.
(iii) හෝමෝ හැබිලිස්. (iv) හෝමෝ ඉරෙක්ටස්

(9) මුල් වරට තිරිඟු වගාකළ ප්‍රදේශය වන්නේ,

(i) මධ්‍යම මෙක්සිකෝ ප්‍රදේශය (ii) උතුරු ඇමරිකානු ප්‍රදේශ
(iii) දකුණු චීන ප්‍රදේශය (iv) මධ්‍යධරණී ප්‍රදේශය

(10) නීග්‍රොයිඩ් මානව වර්ගය ව්‍යාප්ත කලාපය වන්නේ,

(i) අප්‍රිකාව (ii) උතුරු ඇමරිකාව
(iii) ජපානය (iv) ඉන්දියාව

(11) පහත ප්‍රකාශ හා සම්බන්ධ මානවයා වන්නේ ?

★ විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස ඉදිකිරීම
★ එළවළු වර්ග පිස ආහාරයට ගැනීම.

(i) හෝමෝ හැබිලිස් (ii) හෝමෝ ඉරෙක්ටස්
(iii) ඔස්ට්‍රලොපිතිකස් (iv) හෝමෝ නියැන්ඩතාලන්සිස්

(12) වෘත්තයකට අංශක 360ක් ඇති බව,
පැයට මිනිත්තු 60ක් බව,
ඉහත ආකාරයට අපට සිතන්නට පුරුදු කළේ කුමන ශිෂ්ටාචාරයක ගණිතඥයින් ද?

(i) ඊජිප්තු ශිෂ්ටාචාරය (ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය
(iii) මෙසපොතේමයානු ශිෂ්ටාචාරය (iv) චීන ශිෂ්ටාචාරය

(13) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ දී දේව මණ්ඩලයේ ප්‍රධානියා හඳුන්වා ඇත්තේ කුමන නමකින්ද?

(i) එන්කිකි (ii) එන්ලිලි
(iii) සිගුරට් (iv) අනු

(14) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නගරයක් නොවන්නේ,

(i) හරප්පා (ii) කයිරෝ
(iii) ඩොලවීර (iv) කාලිබන්ගන්

(15) ලෝකයේ පැරණිම සාහිත්‍ය කෘතිය රචනා කරන ලද තැනැත්තා වන්නේ,

(i) අක්හේනතන් (ii) ගිල්ගමේෂ්
(iii) හමුරාබි (iv) ටූටන්කමන්

(16) මුල් වරට රබර් බෝලයක් සාදන ලද්දේ කුමන ශිෂ්ටාචාරයක වැසියන් විසින් ද?

(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ
(ii) මායා ශිෂ්ටාචාරයේ
(iii) ඊජිප්තු ශිෂ්ටාචාරයේ
(iv) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ

(17) විජය කුමාරයා සමඟ මෙරට පැමිණි පිරිවරට අයත් සංඛ්‍යාව?

(i) 600 කි (ii) 800 කි
(iii) 700 කි (iv) 900 කි

(18) විජය කුමරු ඇතුළු පිරිස මෙරටට ගොඩබට ස්ථානය?

(i) තම්බපණ්ණිය (ii) ගොඩවාය

(iii) මහාතිත්ථ (iv) සූකරතිත්ථ

(19) විජය කුමරු සමඟ පැමිණි පිරිස් ගම්මාන පිහිටුවා ගත් බව මහා වංශයේ සඳහන් ගංගාව වන්නේ,

(i) කිරිඳි ඔය (ii) කලා ඔය

(iii) ගල් ඔය (iv) මල්වතු ඔය

(20) පහත දක්වා ඇති ජනාවාස අතරින්, අනෙක් ජනාවාස හා නොගැලපෙන ජනාවාසය තෝරන්න.

(i) මහාගාම (ii) දීඝායුගම

(iii) උපතිස්සගම (iv) අනුරාධගම

(ලකුණු 20 X 2 =40)

## II කොටස

★ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.**

(1) (අ) පහත දැක්වෙන ලෝක සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.




(i) A අක්ෂරයෙන් දැක්වෙන ශිෂ්ටාචාරය කුමක් ද?

(ii) E අක්ෂරයෙන් දක්වා ඇති ගංගාව කුමක් ද?

(iii) චීනය දක්වා ඇති අක්ෂරය කුමක් ද? (ලකුණු 06)

(ආ)

(1) A හා B රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(i) A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙම ශිෂ්ටාචාරය බිහිවූයේ කුමන ගංගාවක් ආශ්‍රිතව ද?

(iii) මෙම ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගරයක් නම් කරන්න.



A රූපය

(2)

(i) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය සකස් කර ඇත්තේ කුමකින් ද?

(iii) මෙය සොයාගත්තේ කුමන ස්ථානයෙන් ද?



B රූපය

(2)

1. මූලාශ්‍ර යනු කුමක්ද? කෙටියෙන් දක්වන්න. (ල. 2)
2. ඉතිහාසය ඉගෙනීමට ප්‍රයෝජනවත් වන මූලාශ්‍ර දෙක නම් කරන්න. (ල. 2)
3. ඉතිහාසය හැදෑරීමේදී භාවිතයට ගන්නා වර්ෂ ක්‍රම තුනක් නම් කරන්න. (ල. 3)
4. a. ඔබ පාසලේ ඉතිහාසය හැදෑරීමට උපකාරීවන මූලාශ්‍ර දෙකක් ලියන්න. (ල. 2)

   b. ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 3)

(3) 1. පෘථිවිය නිර්මාණයට බලපෑ දූවිලි වලාව හඳුන්වන්නේ කුමන නමකින්ද? (ල. 2)

2. පහත ප්‍රශ්නය සඳහා පිළිතුර වරහන් තුලින් තෝරා ලියන්න.

(ගොඩබිමේ, මහා හිම යුගය, සිලුරියන් යුගය, ජලයේ)

(i) ලෝකයේ මුල් ම ජීවීන් බිහි වූයේ ?

(ii) පළමු වරට ගොඩබිම සතුන් බිහිවූ යුගය ? (ල. 2)

3. වෙනත් සතුන්ට වඩා මිනිසා ඉදිරියෙන් සිටීමට සාධක තුනක් ලියන්න. (ල. 3)

4. a. පුරා ශිලා යුගයේ මිනිසාගේ ජීවන රටාවේ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 2)

b. නව ශිලා යුගයේදී මිනිසාගේ ජීවන රටාවේ සිදු වූ වැදගත්ම ලක්ෂණ තුන ලියන්න. (ල. 3)

(4)

1. චිම්පන්සියගේ සිට මිනිසකු දක්වා දියුණු වූ ක්‍රියාවලිය හඳුන්වන්නේ කුමන නමකින්ද? (ල. 2)
2. මහාහිම යුගයේ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 2)
3. ගින්දර භාවිතයට ගැනීම නිසා ආදි මිනිසාගේ දියුණුවට හේතු වූ ආකාරයට කරුණු තුනක් ලියන්න. (ල. 3)
4. ආදි මානවයින් සොයා ගත් දේ අප අදටත් ප්‍රයෝජනයට ගන්නා ආකාරයට කරුණු තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(5)

1. මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ වැසියන් වගා කළ ප්‍රධාන ධාන්‍ය වර්ග දෙක නම් කරන්න. (ල. 2)
2. මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ දියුණුවට හේතු වූ ගංගා දෙක ලියන්න. (ල. 2)
3. මෙසොපොතේමියානු සමාජයේ බලවත්ම පිරිස නම් කර, ඔවුන් නියලුනු කාර්යයන් දෙකක් ලියන්න. (ල. 3)
4. a. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වැසියන් භාවිතා කළ ලෝහ වර්ග දෙකක් නම් කරන්න. (ල. 2)

   b. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය අයත්වන ප්‍රධන රටවල් තුන ලියන්න. (ල. 3)

(6)

1. ඊජිප්තු ශිෂ්ටාචාරයට අයත් මිනිසුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කුමක්ද ? (ල. 2)
2. ඊජිප්තු වැසියන් ලෝකයට දායාද කළ විශිෂ්ටතම නිර්මාණය කුමක්ද? එය භාවිතා කළේ කුමක් සඳහාද? (ල. 2)
3. ඊජිප්තු ශිෂ්ටාචාරය ඇසුරින් පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

   (i) ලෝකයේ පුදුම හතෙන් එකක් ලෙස සැලකෙන නිර්මාණය පිහිටි ස්ථානය?

   (ii) අක්ෂර කලාව හඳුන්වන නම ?

   (iii) මළසිරුරු කල්තබා ගැනීමේ ක්‍රමය හඳුන්වන්නේ කුමන නමකින්ද? (ල. 3)
4. චීන ශිෂ්ටාචාරයෙන් ලෝකයට හඳුන්වා දුන් දායාද තුනක් දක්වා, ඉන් එකක් වර්තමානයේදී ප්‍රයෝජනවත් වී ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(7)

1. ඕනෑම රටකට මිනිසුන් පැමිණ පළමුවෙන්ම එහි පදිංචි වීම හැඳින්වෙන්නේ කුමන නමකින්ද? (ල. 2)
2. මුල් ම මානවයන් ජීවත්වීම සඳහා භාවිතා ස්ථාන දෙකක් ලියන්න. (ල. 2)
3. මෙරට ජනාවාස කළ මුල් මානවයන් ආහාරයට ගත් ශාකමය ආහාර වර්ග තුනක් ලියන්න. (ල. 3)
4. a. විජය කුමාරයා මෙරට ගොඩබසින විට, මෙරට සිටි ගෝත්‍ර දෙකක් ලියන්න. (ල. 2)

   b. විජය කුමරු පැමිණෙන විට මෙරට දියුණු ශිෂ්ටාචාරයක් පැවැති බවට සාධක තුනක් ලියන්න. (ල. 3)